# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01.කළමනාකරු (මුදල්) තනතුර -

### (මධ්‍යම කළමනාකරණ පළමු මට්ටම)

**(අ) වැටුප**

**වැටුප් කාණ්ඩය** : 4:1 (MLM 1)

**ආරම්භක වැටුප** : රු.74,120/=

**වාර්ෂික වැටුප් වර්ධකය** : රු. 1,380/=

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 148,000/= ක් පමණ වේ.

**(ආ) යෝග්‍යතාව**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ/ වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ / සහතිකලත් වරලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ අවසන් අදියර සමත් වීම.

සමග

**පළපුරුද්ද**

සමාන තනතුරක වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන :**

සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, අවශ්‍ය වුවහොත් ලිඛිත/ ප්‍රායෝගික පරීක්ෂණයකට සහභාගී විය යුතුය.

**වයස් සීමාව**

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි.)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නිතිරීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක/ කොට්ඨාසයක හෝ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, මානව සම්පත් කොට්ඨාසය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13 යන ලිපිනයට ලැබෙන සේ 2024-01-26 වන දින හෝ ඊට පෙර **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදල දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**